**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**<u>කොළඹ</u>**

**<u>පුවත්පත් නිවේදනය</u>**

## <u>වතුකරයේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය, හෙල්බොඩ ඉදිකළ නිවාස 98කින් සමන්විත භගත් සිං පුරම ගම්මානය ජනතා අයිතියට පත් කිරීම</u>

2019 මාර්තු 24 වන දින නුවරඑළිය, හෙල්බොඩ වතුයායේ, පවත්වන ලද විශේෂ උත්සවයකදී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව නිවාස 98ක් ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා සහ මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා විසින් ජනතා අයිතියට පත් කෙරිණ.

මෙම අවස්ථාව සඳහා උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා සහ විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍ය ගරු රාධාක්‍රිෂ්ණන් මැතිතුමා , පාර්ලිමේන්තු මන්ත්‍රීන් හා මධ්‍යම පළාත් සභාවේ සාමාජිකයන් , වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරින් (PHDT), ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන හැබිටට් ෆො හියුමැනිටි (Habitat for Humanity) සංවිධානයේ නිලධාරීන්, පුස්සැල්ලාව ප්‍රාදේශීය වැවිලි සමාගමේ නියෝජිතයින් සහ ප්‍රදේශවාසීන් විශාල පිරිසක්ද මෙම උත්සවයට සහභාගී වූහ. මාර්තු 23 වන දිනක දිවි පිදූ ඉන්දියානු නිදහස් සටනේ වීරයෙකු වන භගත් සිං ගේ නමින් මෙම ගම්මානය නම් කර තිබේ.

හදිසි අවස්ථාවන්හිදී සහ අර්බුදකාරී අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාවට නිරතුරුව සහයෝගය දැක්වීමට සූදානම් ඉන්දියාව ශ්‍රී ලංකාවේ සැබෑ මිතුරෙකු බව මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ප්‍රකාශ කළේය.

මෙම උත්සවය අමතමින් මහ කොමසාරිස්තුමා අලුතින් ඉදි කරන ලද නිවාසවල හිමිකරුවන්ට සිය සුබ පැතුම් එක් කළේය. ඇමරිකානු ඩොලර් මිලියන 350 කට අධික (ශ්‍රී ලංකා රුපියල් බිලියන 50 ක් පමණ) මුල්‍ය ප්‍රදාන යටතේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ඉන්දීය ආධාර යටතේ විදේශ රටක ක්‍රියාත්මක විශාලතම ආධාර ව්‍යාපෘතිය බව එතුමා පැවසීය. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට නියමිත නිවාස 63,000 න් නිවාස 47,000 ක් මේ වන විට ඉදිකර අවසන් බවද එතුමා සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉන්දියාව නිරතුරුවම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කළ මහ කොමසාරිස්තුමා ඉන්දියානු රජය සහ ජනතාව සාමය හා සමෘද්ධිය වෙත පියමනින ශ්‍රී ලාංකේය ජනතාව සමඟ නිබඳව සිටින බව අවධාරණය කළේය. ඉන්දියාව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය, අධ්‍යාපන, නිවාස, කුසලතා සංවර්ධනය, යටිතල පහසුකම් සහ වෘත්තීය පුහුණුව වැනි විවිධ ක්ෂේත්‍රයන්හි 70 කට අධික ජනතා කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතීන් රැසක් දිවයින පුරා ක්‍රියාවට නංවා ඇත. මෙවැනි ව්‍යාපෘති 20 ක් පමණ මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන්දියාව ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් බිලියන 3 ක පමණ සංවර්ධන සහයෝගිතා ආධාර ලබා දී ඇති අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 560 ක්ම නැවත නොගෙවිය යුතු ප්‍රදාන වේ.

****

කොළඹ

2019 මාර්තු 25